ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 අප්‍රේල් 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා දී තිබූ වාහන දෙකක් පිරිවැයට හෝ තක්සේරු කළ අගයට මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	මෙම වාහන දෙක අපහරණය කිරීමට කටයුතු කරමින් පැවතීම නිසා මූල්‍ය නොවන වත්කම් වල ඇතුලත් කර නොමැති අතර තක්සේරු වටිනාකම ලබාගෙන ඉදිරි වර්ෂයේදී ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කල යුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනා ගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කල අගයට ගිණුම්ගත කල යුතුය.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.	මේ වන විට ඇප තැන්පත් කල යුතු නිලධාරීන් හඳුනාගෙන තැන්පත් කල යුතු ඇප ප්‍රමාණයද තීරණය කර අදාල නිලධාරීන්ට දැනුම් දී ඇත. රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය හා සම්බන්ධීකරණය කරමින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින අතර ඇප තැන්පතු ලේඛනයක්ද සකස් කර ඇති බව දන්වා තිබුණි	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1(ආ)	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.	1.6.1(ආ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමණාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එක් පුනරාවර්තන වැය විෂයක් හා මූලධන වැය විෂයන් තුනක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු 6,000,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.3,368,246 ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට සියයට 20ත් සියයට 98ත් අතර පරාසයක් ගෙන තිබුණි.	අත්‍යාවශ්‍ය නොවන කාර්යාලීය අවශ්‍යතා මිලදී ගැනීම සීමා කිරීම, කාර්යාල ගොඩනැගිල්ලෙහි සිදුකළ සම්පූර්ණ ප්‍රතිසංස්කරණ කටයුතු නිසා ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සීමා කිරීම, පරිගණක හා උපාංග මිලදී ගැනීමට සැලසුම් කල ද අදාල අනුමැතීන් ලබාගෙන සැලසුම් කළ පරිදි ප්‍රසම්පාදන කටයුතු අවසන් කරගත නොහැකි වීම, කාර්යාල ගොඩනැගිල්ලෙහි සම්පූර්ණ ප්‍රතිසංස්කරණයන් එහි හිමිකරු විසින් සිදුකිරීම, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීමේ වියදම් අපේක්ෂිත මට්ටමින් පැන නොනැගීම හේතු ලෙස දන්වා තිබුණි.	නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුය.
(ආ)	එක් පුනරාවර්තන වැය විෂයක් සඳහා මු .රෙ. 66 යටතේ රු.450,000 ක් මාරු කරගෙන තිබුණද ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26ක් වූ රු 156,960ක් ඉතිරිකර තිබූ අතර එක්	කාර්යාල ගොඩනැගිල්ල ශ්‍රී ලංකා යුද හමුදාවේ ශ්‍රමදායකත්වයෙන් ප්‍රතිසංස්කරණය කිරීම	නිසි අධ්‍යයනයකින් යුතුව මු.රෙ. මාරුකර ගැනීමට කටයුතු කල යුතුය.

	මූලධන වැය විෂයක් සඳහා මු.රෙ.66 යටතේ මාරු කර තිබූ රු.1,368,000 න් රු.1,265,834 ක් ඉතිරි වී තිබූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53 ක් විය. ඒ අනුව නිසි අධ්‍යයනයකින් යුතුව මු.රෙ. මාරු කිරීම් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හේතුවෙන් බොහෝ සති අන්ත සහ රජයේ නිවාඩු දිනවලදී කාර්යාල කාර්ය සහායකයින් සහ රියැදුරන් සේවයේ යෙදවීමට සිදුවීම නිසා මු.රෙ. 66 යටතේ රු. 450,000 ක මුදලක් මාරු කර ගැනීමට කටයුතු කළ අතර අපේක්ෂා කළ තරම් අතිකාල රාජකාරී පැන නොනැගීම නිසා රු.156,960 ක මුදලක් ඉතිරි වී ඇත. මු.රෙ.66 යටතේ රු. 1,368,000 ක මුදලක් මාරු කර ගැනීමට කටයුතු කළ නමුත් ඒ සඳහා අදාළ අනුමැතිය ලබාගෙන සැලසුම් කළ පරිදි ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ගැනීමට නොහැකි වීම මත රු.1,265,834 ක මුදලක් ඉතිරි වී ඇති බව දන්වා තිබුණි.	
(ඇ)	භාර බුදලයකට අදාල නිවසක මහාභාරකාර දෙපාර්තමේන්තුවේ කාර්යාලය පවත්වාගෙන යන අතර එහි අලුත්වැඩියා කටයුතු ඩී.බී ජයතිලක භාරය මඟින් සිදු කලද 205-1-1-1-0-2001 සඳහා රු. 1,000,000 ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර වර්ෂය තුළ රු.198,212 පමණක් වැය කර තිබුණි.	ශ්‍රී ලංකා යුද හමුදාවෙහි ශ්‍රමදායකත්වයෙන් කාර්යාල ගොඩනැගිල්ලෙහි සම්පූර්ණ ප්‍රතිසංස්කරණයක් 2024 වර්ෂයේ තුළදී ගොඩනැගිල්ලේ හිමිකරුවන ශ්‍රීමත් ඩී.බී. ජයතිලක බුදලය මගින් සිදුකිරීම නිසා මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වී ඇති බව දන්වා තිබුණි.	අවශ්‍යතා සලකා බලා ප්‍රතිපාදන වෙන් කළ යුතුය.

3.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ජාතික විගණන පනතේ විධිවිධාන වලට අනුකූලව මෙම සහතික වීම ඉදිරිපත් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.2 ඡේදයෙහි සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති අතර කාර්යසාධන වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය				
	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
		රු			
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.5,4.5,4.6 සහ 6.3 උපවගන්තිය	306,500	විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අය විය යුතු වසර දෙකක් ඉක්මවූ හා වසරක කාලයක් ඉක්ම වූ ණය මුදල් අයකරගැනීමට කටයුතුකර නොතිබුණි.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලබාගෙන මෙම ණය ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3.1 ඡේදය		සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාල සීමාවකින් ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද දෙපාර්තමේන්තුව සතු වාහන 09 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.	වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කමිටුවක් පත් කිරීමට කටයුතු කරන ලද අතර, මේ වසර තුළ අදාල චක්‍රලේඛ අනුව සිදුකිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරිම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව නියමිත ආකෘති පත්‍රයට අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කල යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙන් ක්‍රියාකාරකම් මාසිකව ඉදිරිපත් කර ඒ අනුව වගකිව යුතු නිලධාරියා නම්කර නොතිබූ අතර චක්‍රලේඛයට අනුව කාර්ය සාධන දර්ශක හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.	2025 අතුරු සම්මත ගිණුම අනුව මුල් මාස 04 සඳහා ක්‍රියාකාරී සැලැස්ම පළමුව සකස් කරන ලද අතර 2025 අයවැය ඇස්තමේන්තුව සම්මත වූ පසු ඒ අනුව වගකිව යුතු නිලධාරීන් හා කාර්ය සාධන දර්ශකද ඇතුලත් කර නැවත ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති බව දන්වා තිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය.

4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024 නොවැම්බර් 06 දින මාස 04 ක ප්‍රමාදයක් සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කර තිබුණි.	විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ දෙමළ පරිවර්තනය ලැබීම ප්‍රමාද වීම නිසා හා විෂයභාර අමාත්‍යවරයා වෙනස් වීම නිසා ප්‍රමාදයක් සිදු වූ අතර මෙම වසරේ නියමිත කාල සීමාවට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇති බව දන්වා තිබුණි.	මුදල් වර්ෂය අවසන් වී දින 180 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.
(ආ)	වාර්ෂික කාර්යසාධන වාර්තාව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ 2025 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර නොතිබුණු නමුත්, 2025 අප්‍රේල් 08 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. එම කෙටුම්පත් කාර්යසාධන වාර්තාව 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය	දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව , රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	චක්‍රලේඛයේ ඇති ආකෘතිය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව පිළියෙල කල යුතුය.

ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14හි සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය අනුව වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ අවශ්‍ය පරිදි නොපමාව අපහරණය කිරීම කළයුතු වුවත් දෙපාර්තමේන්තුව සතු ධාවන තත්ත්වයේ නොපවතින වාහන දෙකක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කිරීමෙන් තොරව අදාල මෝටර් රථ දෙකෙහි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු. 426,660 ක වියදමක් දරා දෙපාර්තමේන්තු භූමියේ නිශ්කාර්යව පැවතුණි.	මේ වන විට මෙම වාහන 2 අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.4 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව සතු වාහනයකට 2007 ජනවාරි 27 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් වූ රු.254,038 ක අලාභය අදාල රියදුරුගෙන් අයකර ගැනීම සඳහා අධිකරණයේ පවරා තිබූ නඩුව සම්බන්ධව පසු විපරම් සිදු නොකිරීම මත කාලාවරෝධය මත නිෂ්ප්‍රභා වී තිබූ අතර අනතුර සිදු වී වසර 17ක් ගත වුවද අදාල පාඩුව වගකිය යුතු අයගෙන් අයකර ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි.	65-0763 අංක දරන වාහනය පිළිබඳ සිදුවීම 2007 සිදුවුවක් වන අතර ඒ පිළිබඳ ඉදිරි කටයුතු කිරීම සඳහා පරීක්ෂණ කමිටුවක් පත්කර වාර්තාවක් ලබා ගන්නා ලදී. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	අලාභය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

4.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පවතින පෞරාණික වටිනාකමකින් යුතු කළුතර පළාතොට පිහිටි රිච්මන්ඩ් කාසල් ගොඩනැගිල්ල නිසි කාලය තුල විධිමත් පරිදි නඩත්තු කටයුතු සහ අළුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් වහලයෙන් ජලය කාන්දු වී බිත්තිවලට හානි සිදු වී තිබීම හේතුවෙන් අළුත්වැඩියාවන් සිදු කිරීම සඳහා 2023 අගෝස්තු මාසයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් තත්ත්ව වාර්තාවක් ලබාගෙන තිබුනද 2024 දෙසැම්බර් 31 දින වන විටද අළුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි.	කලුතර රිච්මන්ඩ් කාසල් මන්දිරය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ අළුත්වැඩියා කොට සංරක්ෂණය කිරීම සඳහා 2024 දෙසැම්බර් 20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට 2025 ජනවාරි මස 06 වන දින අනුමැතිය හිමිව ඇති බවත් සාකච්ඡා සම්මුති කමිටුවක් හා ව්‍යාපෘති කමිටුවක් පත්කර ගැනීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් නිලධාරීන් පත් කරන ලෙස 2025 අප්‍රේල් 03 දිනැති ලිපියෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතිබව දන්වා තිබුණි.	අලුත්වැඩියා කටයුතු නිසිලෙස නියමිත කාලය තුළ සිදුකල යුතුය.
(ආ)	සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වුවද එම කාර්යය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු නොලබන අතර කාර්යසාධන දර්ශකයක් ලෙස හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.	වර්තමානයේ සමාගමේ 87.5% කොටස් ප්‍රමාණයක් “ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන්” මහාභාරකාර තැන සතු වන අතර මහා භාරකාරතැන සමාගමේ අධ්‍යක්ෂකවරුන් 5 දෙනෙකු පත් කර ඇත. මහාභාරකාර තැන ලේක්හවුස් අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවා එහි ප්‍රගතිය සමාලෝචනය කර ඇත. එසේම ලේක්හවුස් ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහාද මහාභාරකාර දෙපාර්තමේන්තුවෙන් නියෝජිතයෙකු සහභාගී වීම සිදුවේ.	සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කොටස් වල භාරකාරිත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය මහාභාරකාර දෙපාර්තමේන්තුවෙන් සැලසෙන සේවාවක් වන හෙයින් එය කාර්ය සාධන දර්ශකයක් ලෙස හඳුනා ගත යුතුය.

පනත ප්‍රකාරව සභාපති ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම් කළමනාකරණය හා පරිපාලනය කරනු ලබන බැවින් ආයතනයේ ක්‍රියාකාරීත්වය හා කාර්ය සාධනය මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශකයක් ලෙස සැලකිය නොහැකි බව දන්වා තිබුණි.

(ඇ) 1922 අංක 01දරන මහා භාරකාර ආඥා පනත මඟින් ස්ථාපිත කර ඇති මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වනුයේ භාර හා බූදල් කළමනාකරණය කිරීම වන අතර 2024 ක්‍රියාකාරී සැලැස්ම අනුව 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් භාර 1141 ක් හා බූදල් 176 ක පරිපාලනය කටයුතු සිදු කරනු ලබයි. මහා භාරකාර තැන වෙත පැවරෙන භාර හා බූදල් නියෝජ්‍ය මහා භාරකාරවරු දෙදෙනෙක් යටතේ පාලනය වන අතර සංවිධාන සටහනට අනුව එක් නියෝජ්‍ය මහා භාරකාරවරයෙක් යටතේ විදේශ වන්දි අංශය, නීති හා විමර්ශන අංශය හා වතු අංශය පැවති අතර අනෙක් නියෝජ්‍ය මහා භාරකාරවරයා යටතේ වෛද්‍යාධාර/ ශිෂ්‍යාධාර අංශය හා විහාර වන්දි අංශය, පුද්ගල භාර අංශය හා ආගමික අංශය පැවතුණි.

අංශ ප්‍රධානීන් වෙත නියෝජ්‍ය මහා භාරකාරතැන විසින් ලිඛිතව රාජකාරි පවරා තිබුණද එම අංශ ප්‍රධානීන් විසින් එක් එක් අංශයට අයත් ලිපිගොනු යටත් නිලධාරින්ට ලිඛිතව පවරා දී නොතිබුණි.එක් එක් අංශය මඟින් පරිපාලනය කරනු ලබන භාර හා බූදල් ලිපිගොනු ලිඛිතව පවරා දී නොතිබීමෙන් භාර හා බූදල් වල අරමුණු ඉටු කිරීම පිළිබඳව ක්‍රමවත් අභ්‍යන්තර පාලනයක් හා පසුවිපරම් කිරීමක් සිදු නොවීම හේතුවෙන් ලයනල් හා ග්‍රේස් ද අල්විස් භාරය , නීතිඥ ක.දෙ.හේ පියසේන අධ්‍යාපනික භාරය, ලාහුගල ඓතිහාසික මහුල්මහා විහාරස්ථාන

	සංවර්ධන අරමුදල් භාරය, රණවැල්ල ලියනගේවගේ චන්ද්‍රසේකර භාරය, Wjethunga family trust භාරය හා ඩී.එස්.ඩබ්. සමරකෝන් පුන්‍ය භාරය යන භාරයන්ගේ වාර්ෂිකව ඉටු කළ යුතු භාර අරමුණු වාර්ෂිකව ඉටු කර නොතිබුණු බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.		
(i)	දෙහිවල කරගම්පිටිය ශ්‍රී සුබෝධාරාම රජමහා විහාරස්ථානයේ නේවාසිකව වැඩ වාසය කරනු ලබන භික්ෂූන් වහන්සේලාගේ සහ මතුවට වැඩ වාසය කරන්නා වූ භික්ෂූන් වහන්සේලාගේ සෞඛ්‍යමය අවශ්‍යතා සඳහා වෛද්‍යාධාර ලබා දීමේ අරමුණින් 2020 අගෝස්තු 24 දින ස්ථාපක වන වටුතන්තිරිගේ ප්‍රියංග දයාලු ද අල්විස් හා ආරක්ෂක භාරකරු වන මහා භාරකාර තැන විසින් ලයනල් හා ග්‍රේස් ද අල්විස් භාරය පිහිටුවා 2020 අගෝස්තු 26 දින භාරයේ මූලික ප්‍රාග්ධනය සඳහා රු. 262,500 ක් මහා භාරකාර දෙපාර්තමේන්තුවට ස්ථාපක විසින් බැරකර තිබුණි. නමුත් 2020 ඔක්තෝබර් මස සිට 2024 අප්‍රේල් මස දක්වා එක් එක් වර්ෂ වල ලද මුළු පොලිය 2021, 2022 හා 2023 වර්ෂයන්හි එක් එක් වර්ෂයේ ඉහත අරමුණු ඉටු කිරීමට නොයොදවා 2024 වර්ෂයේදී එකවර වර්ෂ තුනෙහිම පොලී මුදල රු. 64,850 ක් දෙහිවල කරගම්පිටිය ශ්‍රී සුබෝධාරාම රජමහා විහාරස්ථානය වෙත බැර කර තිබුණු අතර එම මුදල් භාරයේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන් යෙදවුවේද යන්න පසු විපරම් කිරීමක් සිදු නොවීම හේතුවෙන් භාරයේ අරමුණු ඉටු වේද යන්න පිළිබඳ විගණනයට ගැටලු සහගත විය.	ලයනල් හා ග්‍රේස් ද අල්විස් භාරයට අදාළව මූලික ප්‍රාග්ධනය ආයෝජනය කරනු ලබන්නේ නීති හා විමර්ශන අංශය විසිනි. 2021 හා 2022 කාල වකවානුව තුළ R – 04 යන ගොනු කාණ්ඩය සඳහා විෂය නිලධාරියෙක් නොසිටි හෙයින් එම ගොනු වෙනත් නිලධාරීන්ට ලබා දී තිබුණි. මෙම විෂය ගොනුව 2023 වසරේ R – 03 විෂය නිලධාරිනිය වෙත පැවරීමෙන් පසු එම නිලධාරිනිය විසින් එකවර වර්ෂ තුනේම අරමුණු ඉටු කර ඇත.	නිසිලෙස රාජකාරී පැවරීමක් සිදුකර වාර්ෂිකව භාර අරමුණු ඉටුකළ යුතුය.

(ii)	ශ්‍රේෂ්ඨාධිකරණයේ නිතීඥ ක.දෙ.හේ. පියසේන අධ්‍යාපනික භාරය 2021 මාර්තු 10 දින රු. 250,000 ක මූල්‍ය දායකත්වයකින් පිහිටුවා තිබුණු අතර , එහි මූලික අරමුණ වූයේ හ/ දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලය.(ජාතික පාසල) හි අධ්‍යාපනය ලබන සියලු විෂය ධාරාවලින් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසු දරු දැරියන් අතරින් සුදුසු අයෙකු තෝරා ශිෂ්‍යත්ව පිරිනැමීම. නමුත් පළමු ශිෂ්‍යත්වය ලෙස 2023 වර්ෂයේ දෙබරවැව පාසලෙහි ශිෂ්‍යයෙකු වෙත රු. 6,700/- මුදලක් චෙක්පතකින් පිරිනමා තිබුනද එය එම ශිෂ්‍යයා වෙත නොලැබු බව 2025 අප්‍රේල් 25 දින ක.දෙ.හෙ පියසේන මහතා විසින් මහා භාරකාර තැන වෙත ලිඛිතව දැනුම් දී තිබුණි. 2022 වර්ෂයෙන් පසු 2025 අගෝස්තු 31 දින වන විටත් මෙම භාරයෙන් කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනමා නොතිබුණි.	ඒ අනුව 2022 වසරේ උපචිත වූ පොලී මුදල් යොදාගෙන පාසල විසින් දන්වා එවූ විතාරණ ගමගේ දිදුල ශ්‍රී සත්සර වෙත 2023 දෙසැම්බර් 27 වන දින ස්ථාවර නියෝග අංක 64 මඟින් අදාළ මුදල ගිණුම් ගත කර ඇත. පසුව 2024 වර්ෂයේ අරමුණු ඉටු කිරීම සඳහා 2024 ජූලි 10 වන දින ගෙවිය හැකි මුදල (රු.34,600.00) ගණනය කර ඒ බව දන්වා ස්ථාපකටද පිටපත් සහිතව පාසල වෙත සිසුවකු නම් කර එවන ලෙස දන්වා ඇත. නමුත් ශිෂ්‍යයෙකු නම් කර එවා නොමැති හෙයින් 2024 වර්ෂයේ ගෙවීම් සිදු කර නොමැත.	වාර්ෂිකව පසු විපරම් කිරීමක් සිදු කර භාර අරමුණු අනුව වාර්ෂිකව ශිෂ්‍යත්ව ලබාදීමට කටයුතු කළයුතුය.
(iii)	ගිරාගම්මන ගෙදර රංජිත් යන ස්ථාපක විසින් 2020 සැප්තැම්බර් 24 දින අම්පාර, ලාහුගල ඓතිහාසික මගුල් මහා විහාරස්ථාන සංවර්ධන අරමුදල් භාරය පිහිටුවා ඇති අතර මූලික ප්‍රාග්ධනය ලෙස රු. 50,000 ක් ස්ථාපක විසින් යොදවා තිබුණි. භාරයේ අරමුණු වන ඓතිහාසික මඟුල් මහා විහාරස්ථානය සතු විහාරාරාංගයන් සංවර්ධනය කිරීම හා අලුත්වැඩියා කිරීම විහාරස්ථානයේ ආලෝක පූජාවන් සඳහා දායක වීම සහ විහාරස්ථානයේ වැඩ වාසය කරනු ලබන මහා සඟරුවනට සිව්පසයෙන් සංග්‍රහ කිරීම , වාර්ෂිකව මූල්‍යමය දායකත්වය සැලසීම යන අරමුණු ඉටු කිරීම සඳහා 2022 ,2023 හා 2024 වර්ෂ වලට අදාලව නිදහස් කල යුතු ආයෝජන පොලී මුදල වාර්ෂිකව අරමුණු ඉටු කිරීමෙන් තොරව එකවර 2025 ජූලි 21 දින රු 7,850 ක් පූජ්‍ය ඉදිගස් ඇල්ලේ පුන්‍යාසාර හිමි වෙත ගෙවා තිබුණි.	2022 වසරේදී R – 04 යන ගොනු කාණ්ඩය සඳහා විෂය නිලධාරියෙක් නොසිටි හෙයින් එම ගොනු වෙනත් නිලධාරීන්ට ලබා දී තිබුණි.මෙම විෂය ගොනුව 2023 වසරේ R – 03 විෂය නිලධාරිනිය වෙත පැවරීමෙන් පසු එම නිලධාරිනිය විසින් එකවර වර්ෂ දෙකේම අරමුණු ඉටු කර ඇත. නිවැරදි පසු විපරමක් තිබූ බැවින් 2024 වසරේදී අරමුණු ඉටුකර ගැනීම සාර්ථකව සිදුකර ඇත.	නිසිලෙස රාජකාරී පැවරීමක් සිදුකර වාර්ෂිකව ඉටුකල යුතු භාර අරමුණු වාර්ෂිකව ඉටුකල යුතුය.
(iv)	රන්මලී සේපාලිකා රනවැල්ල යන ස්ථාපක විසින් හෙල්ප්ඒජ් ශ්‍රී ලංකා ආයතනයේ කටයුතු සඳහා සහ පරිවාස සහ ළමාරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ දිළිඳු දරුවන්ට උදවු	මෙම ගොනුව 2024 වර්ෂයේ අග භාගය තෙක් නීති හා විමර්ශන අංශයේ පැවති අතර 2025 වර්ෂයේ මුල් කාර්තුවේ දී ආගමික අංශය වෙත ලැබී	භාර ඔප්පුවේ සඳහන් අරමුණු ඉටුකිරීමට 2වග බලා ගතයුතුවීම.

	උපකාරකිරීම සහ ශ්‍රී වජිරඤාණ ධර්මායතනයට බෞද්ධාගමික ප්‍රචාරක කටයුතු සඳහා පොත් සහ පත්‍රිකා ඉංග්‍රීසි,ප්‍රංශ සහ ජර්මන් භාෂාවලින් මුද්‍රණය කර බෙදාහැරීම යන අරමුණු සඳහා 2021 ඔක්තෝබර් 29 වන දින රණවැල්ල ලියනහේවගේ චන්ද්‍රසේකර භාරය, පිහිටුවා ඇති අතර මූලික ප්‍රාග්ධනය ලෙස මීට ප්‍රථම පිහිටුවා තිබූ රණවැල්ල ලියනහේවගේ චන්ද්‍රසේකර බුදලයෙන් ලද ආදායම යොදවන ලෙස දක්වා තිබුන අතර 2024 ජූලි 15 දින රු. 344,878ක මුදල පැවරුම් පත්‍රයක් මඟින් රණවැල්ල ලියනහේවගේ චන්ද්‍රසේකර භාරයට බැර කර තිබුණි. 2021 සිට 2025 වර්ෂය වන විට වර්ෂ 04 ක් ගත වී ඇතත් මෙතෙක් එම භාරයේ අරමුණ ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.	ඇත.අරමුණු ඉටු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.	
(v)	2023 පෙබරවාරි 22 දින දෙපාර්තමේන්තුවට ලද Wijethunga Family Trust යන භාරයට අයත් භාර ඔප්පුව හා අදාල ලේඛන විදේශයකදී සැකසූ ලේඛන බැවින් නීතිඥවරයෙකු සමග සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කල යුතු බව 2023 අගෝස්තු 17 දින ගොනුවේ සටහන් පත්‍රයේ දක්වා තිබුනද මේ දක්වා නීතිඥයෙකු සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකර භාරයේ අරමුණු ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.	Wijethunga family Trust නමැති භාරය ආරම්භ කිරීමට නම් ඒ සඳහා ලියා ඇති අන්තිම කැමති පත්‍රය ඔප්පු කරවා ගැනීම සඳහා තෙස්තමේන්තු නඩුවක් ගොණුකර ප්‍රොබේට් බලපත්‍රය මහා භාරකාර තැන නමින් ලබා ගත යුතු වේ. ප්‍රොබේට් බලපත්‍රය ලැබීමෙන් පසු භාරයේ අරමුණු ඉටු කිරීමට හැකියාව ලැබේ. මෙම ගොනුව 2024 වර්ෂයේ අග භාගය තෙක් නීති හා විමර්ශන අංශයේ පැවති අතර 2025 වර්ෂයේ මුල් කාර්තුවේ දී ආගමික අංශය වෙත ලැබී ඇත. අරමුණු ඉටු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.	අවශ්‍ය ලේඛන අප්‍රමාදව සකසා භාර අරමුණු ඉටුකල යුතුය.
(vi)	දිවියාගහ යසස්සි හිමියන් විසින් බෞද්ධායතන සංවර්ධන භාරය 2007 නොවැම්බර් 07 දින රු. 5,000 ක මූලධනයකින් බෞද්ධායතනයේ ඉදිරි සංවර්ධන කටයුතු උදෙසා මුදල් යෙදවීම, විහාරස්ථ සමාජ සුභ සාධන සේවා කටයුතු පුළුල් කිරීම, බෞද්ධ ජනතාවගේ සිත් සතන් තුල ආගමික , සාමාජීය හා සංස්කෘතික වශයෙන් පුනරුදයක් ඇති කරලීම සඳහා ධර්ම ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන අරමුණු සඳහා පිහිටුවා ඇති අතර,	2024 වර්ෂයේ දී දිවියාගහ යසස්සි ස්වාමීන් වහන්සේ දැනුවත් කර ලිපි යවා ඇති අතර උන්වහන්සේ විසින් 2024.10.08 වන දිනැති ලිපිය මඟින් සඳහන් කර ඇත්තේ උන්වහන්සේ බොහෝ අසනීප තත්ත්වයෙන් පෙළෙන බවත් , ප්‍රතිකාර සඳහා විශාල මුදලක් වැය වන බවත් ය. මෙම මුදල මහා භාරකාර පුණ්‍ය භාරයකින් පියවාගෙන උන්වහන්සේ එම	භාරයක මූලධනය එම භාරයේ අරමුණ සඳහා යෙදවිය යුතුය.

	එදිනම ඉහත භාරයේ පුණ්‍ය කටයුතු වලට වැය කිරීම සඳහා රුපියල් දස ලක්ෂයක මුදලක් ලබා දෙන මෙන් දිවියාගහ යසස්සි හිමියන් කල ඉල්ලීම සලකා බලා වෙනත් භාරයක් වන සී. ඊ වනිගසූරිය බුදල් ගිනුමේ මුදලින් එම මුදල ණය මුදලක් ලෙස ගෙවා තිබුණු අතර එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. වෙනත් අරමුණක් වෙනුවෙන් පිහිටුවා ඇති භාරයක මුදල් තවත් භාරයක් වෙනුවෙන් ණයට ලබා දීම තුලින් භාරයන්ගේ අරමුණු වෙනුවෙන් මුදල් භාවිතා නොකරන බව නිරීක්ෂණය විය.	තත්ත්වයෙන් නිදහස් කරන ලෙසත් ඉල්ලා ඇත. ඉහත කරුණු පදනම්ව එම මුදල් තවදුරටත් අයකර ගැනීමට අපහසු තත්ත්වයක් පැන නැගී ඇත. එබැවින් අදාළ ඉදිරි කටයුතු සඳහා නීති හා විමර්ශන අංශය වෙත ගොනුව භාරදීමට කටයුතු කරමින් පවතී.	
(vii)	දොන් සයිමන් විජේවික්‍රම මහතා විසින් 1950 වර්ෂයේදී ලියන ලද අන්තිම කැමති පත්‍රය මගින් ඩී.එස්. ඩබ්ලිව්. සමරකෝන් පුණ්‍ය භාරය පිහිටුවා ඇති අතර දොන් සයිමන් විජේවික්‍රම මහතාගේ නිශ්චල හා චංචල දේපල වලින් ලැබෙන කුලී ආදායම් හා ලාභය යොදවා භාරයේ අරමුණු වන පිලියන්දල නගරයේ ඉදිකිරීමට යෝජිත රෝහලෙහි වාට්ටුවක් ඉදිකිරීමටත්, එය ඔහුගේ නැසීගිය මවගේ නමින් නම් කිරීමටත් මහා භාරකාර තැන වෙත පවරා තිබුණි. මේ වන විටත් එම රෝහලෙහි වාට්ටුව ඉදිකිරීමට කටයුතු කිරීමෙන් තොරව මූලික අරමුණින් පරිබාහිරව වෙනත් භාණ්ඩ (වෛද්‍ය නොවන උපකරණ) පරිත්‍යාග කිරීමක් පමණක් සිදු කර තිබුණි.	අන්තිම කැමති පත්‍රයේ අරමුණක් ලෙස සඳහන් වන්නේ පිළියන්දල ඉදි කිරීමට යන යෝජිත රෝහලේ වාට්ටුවක් ඉදි කිරිමයි. එම රෝහල ඉදිකිරිම සිදු කලාද නැද්ද යන්න තොරතුරු අප සතුව නොමැත. ඒ වෙනුවට සැරහුම් ඒකකය හා රෝගීන් සඳහා ආහාර සකස් කරනු ලබන මුළුතැන්ගෙය නවීකරණය කිරිම සඳහා ඉල්ලීම් කර ඇත. 2023 නොවැම්බර් 29 දිනැති ලිපිය මගින් අදාළ තොරතුරු එවන ලෙස දන්වා යවා ඇති අතර පසුව 2024 පෙබරවාරි 12 හා 2025 ජූලි 03 වන දින ලිපි මගින්ද විමසීම් සිදු කර ඇතත් මේ වන තෙක් තොරතුරු ලැබී නොමැත.	නැවත නැවත පසුවිපරම් කිරීමක් කර භාර අරමුණු ඉටු කල යුතුය.
(ඇ)	මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ආඥා පනතේ 47 (1) වගන්තියට අනුව මහා භාරකාර වරයාගේ ගිණුම් අමාත්‍යවරයා විසින් නියම කරන ඕනෑම අවස්ථාවක එසේ නියම කරනආකාරයට නියමිත තැනැත්තකු විසින් යටත් පිරිසෙයින් වාර්ෂිකව එක් වරක් හෝ විගණනය කළ යුතුවුවත් එම ගිණුම් විගණනයක් සිදු කර නොතිබුණි.	වාර්ෂිකව භාරයන්ගේ අවසන් ගිණුම් සැකසීමෙන් පසු භාර ගිණුම් සම්බන්ධයෙන් විගණනයක් සිදු කිරීම මේ දක්වා ක්‍රියාත්මකව නොමැත.	මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ආඥා පනත අනුව කටයුතු කලයුතුය.

(ඉ)	මහා භාරකාර ආඥා පනතේ 4(4) වගන්තිය අනුව ආඥාපනත පරිපාලනය කිරීමේ හිලා මහා භාරකාර වරයාට හෝ යම් නියෝජ්‍ය මහා භාරකාරවරයකුට සහය වීම පිනිස අවශ්‍ය විය හැකි යම් නීති නිලධරයන් සහ අනෙකුත් කාර්යමණ්ඩලය පත්කරනු ලැබිය හැකි අතර ආඥා පනතේ 52 වගන්තිය අනුව මෙම ආඥා පනතේ අරමුණු බලාත්මක කිරීම සඳහා වගන්තියේ සඳහන් කාර්යන් හෝ සියලුම කාර්යන් සඳහා අමාත්‍යවරයා විසින් නීති සෑදිය යුතු බව දක්වා ඇත. පනතේ 52 (1) එ වගන්තිය අනුව මෙම ආඥා පනත යටතේ නියම කල යුතු රීති සෑදීම සඳහා අවශ්‍ය කාරනා සම්බන්ධයෙන් රීති සැකසිය යුතු වුවත් දෙපාර්තමේන්තුව භාර හා දේපල පරිපාලනය කිරීමේ රීතියක් ලෙස නිෂ්චිත අනුමත කරන ලද බදවා ගැනීමේ පටිපාටියක් ස්ථාපනය කර නොතිබුණි.	රීති සකස් කර විධිමත් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.	පනත ප්‍රකාරව රීති සකසා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කළ යුතුය.
(ඊ)	දෙපාර්තමේන්තුවේ වතු පාලන අධ්‍යයනය කිරීම සම්බන්ධ විශේෂ කමිටුවේ වාර්තාව ක්‍රියාත්මක කිරීම යන මැයෙන් අංක PT/10/01/01/10/07 දරන 2008 ජනවාරි 01 සිට බලාත්මක වන චක්‍රලේඛයක් වතු පරිපාලන කටයුතු සඳහා පැවතිය ද එම චක්‍රලේඛය රීතියක් ලෙස බලාත්මක කර නොතිබුණි.	මෙම චක්‍රලේඛය රීතියක් ලෙස බලාත්මක කර නැත . නමුත් මහා භාරකාරවරු මෙය අවස්ථානුකූලව උපදේශයක් ලෙස භාවිතා කර ඇත.	පනත ප්‍රකාරව රීති සැකසිය යුතුය.
(උ)	2024 මැයි මස 08 දින මහා භාරකාර තැන වෙත පවරා ඇති බුදල් දේපළ කළමනාකරණය සම්බන්ධව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පහත නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. • නීතිපති උපදෙස් ද ලබාගෙන ආඥා පනත සංශෝධනය කර හෝ දිසා අධිකරණ වලින් අදාල අවසරය ලබාගෙන මහා භාරකාර තැන වෙත පවරා ඇති බූදල් , දේපල පරිපාලනය ප්‍රාදේශීය වශයෙන් සිදු කිරීම සඳහා දිස්ත්‍රික්ක 25 හිම දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම්වරුන් සම්බන්ධ කර ගනිමින් සුදුසු යාන්ත්‍රණයක් කඩිනමින් සකස් කරන ලෙස නිර්දේශ කර තිබුනද වර්තමානය වන විට බූදල් , දේපල පරිපාලනය ප්‍රාදේශීය වශයෙන් සිදු කිරීම සඳහා යාන්ත්‍රණයෙන් සකස්	මහා භාරකාර තැන වෙත පවරා ඇති බූදල් දේපළ පරිපාලනය ප්‍රාදේශීය වශයෙන් සිදුකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැවරීමට මහාභාරකාර ආඥා පනතේ විධිවිධාන සලසා නොමැත. බූදල් දේපළ පරිපාලනය ප්‍රාදේශීය වශයෙන් සිදුකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැවරීම සම්බන්ධයෙන් ඇමතිතුමා විසින් හෝ අමාත්‍යාංශ ලේකම් විසින් අප වෙත ලිඛිතව උපදෙස් ලබාදී නොමැත. නමුත් අවශ්‍යතාව මත හා අවස්ථානුකූල පරිදි මහාභාරකාර දෙපාර්තමේන්තුව සතු දේපළ පරිපාලනයට හා	භාර අරමුණු ඉටුකිරීම සඳහා දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් ගේ සහාය ලබාගත යුතුය.

කර නොතිබුණි.	විදේශයන්හි මියගිය සේවා නියුක්ත යන්ගේ වන්දි ගෙවීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් අවශ්‍ය සහයෝගය ලබා ගැනීම දැනටමත් සිදුකරයි.	
• මහා භාරකාරතැන වෙත වත්කම් ලැබෙන විවිධ මාර්ග කවරේද යන්න සහ එම එක් එක් වත්කම ලැබුණේ කවදාද පවරනු ලැබුවේ කවුරුන් විසින්ද , පැවරීමට අදාල කොන්දේසි කවරේද ආදී කරුණු ඇතුලත් ලේඛනයක් සකස් කරන ලෙස නිර්දේශ කර තිබුනද 2025 අගෝස්තු 31 දින වන විටද එවැනි ලේඛනයක් සකස් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවට පවරා ඇති දේපළ සම්බන්ධ විස්තර ඇතුළත් වාර්තාවේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කර ඇත.	දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරන සියලු භාර හා මුදල් වල විස්තර ඇතුලත් ලේඛනයක් සකස් කල යුතුය.
• පාඩු ලබන වතු සම්බන්ධයෙන් එම වතු බදු දීමට අමතරව යුධ හමුදාව , සිවිල් ආරක්ෂක බලකාය හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුව ආදී ආයතන සමඟ සාකච්ඡා කර සෙබළුන් හා සිරකරුවන් යොදවා මෙම ඉඩම් වඩාත් ඵලදායි වගා කටයුතු හා වෙනත් කර්තව්‍යයන් සඳහා යෙදවීම වැනි විකල්ප ක්‍රම අනුගමනය කරන ලෙස පෙන්වා දී ඇතත් පාඩු ලබන සුදුවැලිපොත, මළුවහේන හා මහනුගලන්ද යන වතු සම්බන්ධයෙන් එවැනි විකල්ප ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබුණි.	ආර්ථිකමය වශයෙන් වගාවකට හෝ යම් කාර්යයකට යොදා ගත හැකි ඉඩම් කොටස් පමණක් බදුදීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	පාඩු ලබන වතු බදු දීම හෝ ඵලදායී වගාවක් සඳහා යෙදවීම සඳහා අදාල ආයතන සමඟ සාකච්ඡා කර ක්‍රියාමාර්ග ගත යුතුය.
• ගාල්ල බද්දේගම සුදුවැලිපොත පිහිටි හැරී හපුගොඩ බූදලයට අයත් අක්කර 113 ක භූමි ප්‍රමාණය බදු දීම සඳහා මිල කැඳවූ නමුත් ලද වැඩිම ලංසු අගය අපේක්ෂිත රජයේ තක්සේරුවට වඩා අඩු අගයක් ගැනීම හේතුවෙන් බදු දීමට කටයුතු කර නොතිබූ අතර කාරක සභාව විසින් එම දේපල බදු දීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් සිදු කරන ලෙස උපදෙස් ලබා දී තිබුනත් 2025 අගෝස්තු 31 දින වන විටද ටෙන්ඩර් කැඳවීමක් සිදු කර බදු දීමට කටයුතු කර	පැවරීමට පෙර සිට පදිංචිව ඇති පුද්ගලයන් හා බදු දීමේදී බවතින අනෙකුත් දුර්වලතා හඳුනාගෙන ඉදිරියේදී බදු දීම සඳහා කටයුතු කරනු ඇත.	නැවත මිල ගණන් කැඳවා බදු දිය යුතුය.

නොතිබුණි.		
• විහාරස්ථාන 417 සඳහා විහාර වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීමට අදාල හේතු හා ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය පිළිබඳ වර්ගීකරණය කල කාලානුරූප ලේඛනයක් සකස් කරන ලෙස දන්වා තිබුණද එවැනි ලේඛනයක් සකස් කර ඇතත් ප්‍රමාද වීමට හේතු දක්වා නොතිබුණි.	බෞද්ධ සිද්ධස්ථාන දේපල සම්බන්ධයෙන් විහාර දේවාලගම් ආඥා පනතින් 318 වන අධිකාරිය සංශෝධනය කිරීම යටතේ මහා භාරකාරවරයා වෙත පැවරී තිබූ බලතල , එම පනතට කරන ලද 1981 අංක 42 දරණ සංශෝධනය ප්‍රකාරව, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇත.එසේ හෙයින් විහාර වන්දි ලබා දීමට හෝ විහාර වන්දි ලබා ගන්නා අර්ථලාභීන්ට අවශ්‍ය ලෙස විහාර වන්දි පරිහරණය කිරීමේ කිසිඳු බලයක් මහා භාරකාරවරයාට නොමැත. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝගය පමණක් ක්‍රියාත්මක කළ හැක.	ගෙවීම් ප්‍රමාදවී ඇති විහාරවන්දි ප්‍රමාදවීමට හේතු හා ගෙවීමට ඇති මුදල් ඇතුලත් ලේඛනයක් පිළියෙල කල යුතුය.
• 2009 හා ඊට පෙර නොගෙවූ විදේශ වන්දි මුදල තුළ 1991 වර්ෂයට පෙර සිට එන හඳුනා ගනිමින් පවතින රු 59,145,636 ක ශේෂය 2025 අගෝස්තු 31 දින වන විටත් හඳුනා ගෙන නොතිබුණි.	2009 හා ඊට පෙර නොගෙවූ වන්දි ලෙස සඳහන් කර ඇත්තේ අප සතුව දැනට පවතින ලේඛන මත පදනම්ව සොයාගත් කරුණු වන අතර එහිදී ඒවා නිශ්චිත වශයෙන්ම තහවුරු කර ගැනීමට නොහැකිව පවතී.	නොගෙවූ විදේශ වන්දි හඳුනා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
• මහා භාරකාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි තොරතුරු යාවත්කාලීන කිරීම සම්බන්ධව වූ නිර්දේශ අතර දෙමළ පරිවර්තනයක් නොතිබීම සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු වී තිබූ අතර ඒ සම්බන්ධව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන්, අවශ්‍ය අයදුම්පත් හා දේපළ සම්බන්ධ තොරතුරු ඇතුලත් කර එහි දෙමළ පරිවර්ථනයක් සිදුකර නොතිබුණි.	කෝප් කමිටු නිර්දේශ පරිදි දෙපාර්තමේන්තුවෙන් සිදුවන සේවාවන්ට අදාල අයදුම්පත් සිංහල හා ඉංග්‍රීසි වෙබ් පිටු වෙත ඇතුලත් කරන ලදී. දෙමළ බසින් අයදුම්පත් සකස් කරන ලද අතර එම අයදුම්පත් හා තොරතුරු කඩිනමින් දමිළ වෙබ් පිටුව වෙත ඇතුලත් කරනු ලැබේ.	දෙපාර්තමේන්තුවේ විසින් සපයනු ලබන සේවාවන්ට අදාල අයදුම්පත් වල දෙමළ පරිවර්ථනයක් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ඇතුලත් කළ යුතුය.